# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2419/03 – 2025 ජනවාරි මස 15 වැනි බදාදා – 2025.01.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

2025.01.01 සිට 2025.04.30 දක්වා වූ ආදායම් වියදම් ඇස්තමේන්තුව

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හයවන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27(අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අවසර දීම**

2025 වර්ෂයේ ජනවාරි 01 සිට අප්‍රේල් 30 දින දක්වා මාස හතරක සේවා වියදම සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා සබරගමුව පළාත තුළ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මාස හතරක් තුළ සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් වියදම් සඳහා ඒ කාලය තුළ අවශ්‍ය වන මුදල් සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, සබරගමුව පළාත් සභා අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුෂාංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ නියෝගයකි.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා වන මා විසින් මෙසේ පනවනු ලැබේ. මෙම නියෝගය 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය යටතේ ගරු ආණ්ඩුකාරතුමිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 නොවැම්බර් මස 29 වන දින අනුමත කරන ලද 2025 වර්ෂයේ මුල් මාස හතර සඳහා ආදායම් වියදම් ඇස්තමේන්තුවේ සංශෝධනය කිරීම සඳහා ලබා දෙන නියෝගයකි.

1. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2025 අප්‍රේල් මස 30 වන දිනෙන් අවසන් වන මාස හතරක කාල සීමාව සඳහා සබරගමුව පළාත් සභාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරුකර ඇති රුපියල් විසිඑක් බිලියන තුන්සිය හතළිස් එක් මිලියන එකසිය — අවසරය ලබා දීම.

දහසක් (රු. 21,341,100,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන්දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.

2025 මුල් මාස හතර සඳහා විසර්ජන.

2\. (1). යම් මුදලක් වැය කිරීමට බලයදෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ නියෝග යෙහි "මාස හතරක කාලය" යනුවෙන් සඳහන් කරනු ලබන, 2025 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භව 2025 අප්‍රේල් මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රුපියල් විසිඑක් බිලියන තුන්සිය හතලිස් එක් මිලියන එකසිය දහසක් (රු. 21,341,100,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් :-

(අ). සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් හා

(ආ). සබරගමුව පළාත තුළ ණය වශයෙන් ලබා ගන්නා මුදල්වලින් හෝ සබරගමුව පළාත් සභාව සඳහා ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින් පියවිය යුතුය. මෙහි ඉහත සඳහන් කළ රුපියල් විසිඑක් බිලියන තුන්සිය හතලිස් එක් මිලියන එකසිය දහසක් (රු. 21,341,100,000) වූ මුදල මේ නියෝගයේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2). මේ වගන්තියේ (I) වන උප වගන්තියෙහි විධිවිධාන සබරගමුව පළාත් සභාව සඳහා හා එය වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියකට විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතුය.

2025 වර්ෂයේ මුල් මාස හතර සඳහා සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීම.

3\. (1). 2025 මුදල් වර්ෂයේ මුල් මාස හතරක කාල සීමාව තළදී, මේ නියෝගයේ දෙවන උපලේඛනයේ IV වන තීරුවේ සඳහන් එක් එක් කටයුත්තෙන් සබරගමුව පළාත් සභාවට ලැබෙන VI වන තීරුවෙහි සඳහන් ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළයුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්ථය, VI තිරුවෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතුය.

4\. මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2025 මුදල් වර්ෂයේ මුල් මාස හතරක කාල සීමාව තුළ සබරගමුව පළාත් සභාව විසින් කරනු ලබන වියදම්, ඒ කාලය තුලදී එම කටයුත්තෙන් සබරගමුව පළාත් සභාව ලබන ලැබීම්වලින් ගෙවිය යුතුය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ V වන තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

5\. මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2025 මුල් මාස හතරක කාල සීමාව අවසානයේ දී හිගව ඇති හර ශේෂය, එම උපලේඛනයේ VII තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතුය. තවද, එම කාලය අවසානයේදී එම කටයුත්තේ මුළු බැරකම් VIII වන තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතුය.

2025 මුල් මාස හතර තුලදී 3 වන වගන්තියේ සඳහන් කටයුතු පිළිබඳ වියදම් සඳහා සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ මුදල් වලින් අත්තිකාරම් ගෙවීම.

6\. 2025 මුදල් වර්ෂයේ මුල් මාස හතරක කාල සීමාව තුළ යම් අවස්ථාවක මේ නියෝගයේ දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන යම් කටයුත්තකින් සබරගමුව පළාත් සභාවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන්, සබරගමුව පළාත් සභාව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා යයි ආණ්ඩුකාරවරයා සළකන මුදල් සබරගමුව පළාත් අරමුදලෙන් හෝ මුදල් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කළින් කළ විධාන කරනු ලැබිය හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්ථය එම උපලේඛනයේ පස්වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරීම වියදම් සීමාව නොඉක්ම විය යුතුය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, මා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට සබරගමුව පළාත් සභා අරමුදලට ආපසු ගෙවිය යුතුය.

7. (1). මේ නියෝගයෙහි පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශිර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට එම උපලේඛනයේ විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබූවා වූ ද, එහෙත් වියදම් නොකර ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු වියහැකි වූද යම් මුදලක්, එම වැඩ සටහනේම මූලධන වියදම් වශයෙන් හෝ වෙනත් වැඩ සටහනක පුනරාවර්තන හෝ මූලධන වියදම් වශයෙන් හෝ වෙන් කිරීමට හෝ ප්‍රධාන ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියකුගේ හෝ නියමය අනුව මාරුකළ හැකිය.

(2). මේ නියෝගයෙහි පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශිර්ෂයක් යටතේ දැක්වෙන මූලධන වියදමට වෙන් කරන ලද මුදලක් ඒ ශිර්ෂයේ වැඩසටහනෙන් හෝ ව්‍යාපෘතියෙන් පිටතට මාරු කිරීම ප්‍රධාන ලේකම්වරයාට පමණක් ම කළ හැකිය.

වැඩ සටහන පුනරාවර්තන වියදම් සඳහා වෙන්කරන ලද නමුත් වියදම් නොකරන ලද මුදල් ඒ වැඩ සටහනේම වෙනත් වෙන් කිරීමකට හෝ ඒ වැය ශීර්ෂය යටතේම වූ වෙනත් වැඩසටහනකට හෝ මාරු කිරීමේ බලය

8. (1). බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු වියහැකි බවට ඃහෝ

(2). යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල තවදුරටත් අවශ්‍ය නොවන බවට ආණ්ඩුකාරවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ වියදම් කිරීම සඳහා කළින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන්ම හෝ ඉවත් කරගැනීම, ආණ්ඩුකාරවරයා විසින් කරනු ලැබිය හැකිය.

9. ආණ්ඩුකාරවරයා විසින්:-

(අ). මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ V වන තීරයෙහි, VII වන තීරයෙහි සහ VIII තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්

(ආ). මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ VI වන තීරයෙහි දැක්වෙන අවම සීමාඃ නියමයන් මගින් 2026 මැයි මස 31 දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

මේ නියෝග යෙහි දෙවන උපලේඛනයේ දක්වෙන උපරිම හා අවම සීමා වෙනස් කිරීමට ආණ්ඩුකාර වරයාට ඇති බලය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, ආණ්ඩුකාරවරයා විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතුය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතවම සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැළකිය යුතුය.

10. ආණ්ඩුකාරවරයා විසින්, ලිඛිත නියෝගයක් මගින්, මේ නියෝගයෙහි දෙවන උපලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ:-

(අ). එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියළුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්.

(ආ). එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

11. මෙම අවසරය සබරගමුව පළාතේ හත් (7) වන පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි සිට හෝ මාස තුන (03) ක කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2025 අප්‍රේල් මස 30 වන දිනය හෝ යන දෙකෙන් කළින් එළඹෙන දිනෙන් අවසන් වන්නේය.

ඒ.ඒ.සී.ජේ. රාජරත්න,
ගරු ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2024 දෙසැම්බර් 30 වෙනි දින.

## පළමුවන උපලේඛනය
## පළාත් සභා පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්
## ශීර්ෂ 800 සිට 861 දක්වා

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | 18,341,100,000 |
| ප්‍රාග්ධන වියදම් | 3,000,000,000 |
| එකතුව | 21,341,100,000 |

| ශීර්ෂය | ආයතන හා වැඩ සටහන | පුනරාවර්තන වියදම රුපියල් | ප්‍රාග්ධන වියදම රුපියල් |
|---|---|---|---|
| 800 | ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 42,100,000 | 2,000,000 |
| 801 | පළාත් සභා ලේකම් කාර්යාලය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 84,935,000 | 500,000 |
| 802 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 22,027,000 | 500,000 |
| 803 | සමූපකාර සේවක කොමිෂන් සභා කාර්යාලය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 6,211,000 | - |
| 804 | ප්‍රධාන ලේකම් | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 93,815,000 | 201,000,000 |
| 805 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 22,030,000 | - |
| 806 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 26,442,000 | - |
| 807 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 28,312,000 | - |
| 808 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | | |
| | 50 වැනි වැඩසටහන - ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 162,078,000 | - |
| 809 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 44,542,000 | - |
| 810 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 76,263,000 | 10,000,000 |
| | 47 වැනි වැඩසටහන - ප්‍රවාහන සේවා | 22,000,000 | 33,000,000 |
| | 49 වැනි වැඩසටහන - විදුලිබල හා බලශක්ති සේවා | - | 21,000,000 |
| | 53 වැනි වැඩසටහන - සමූපකාර සංවර්ධනය | - | 21,000,000 |
| | 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධනය | 42,000,000 | 202,000,000 |
| | 61 වැනි වැඩසටහන - නිවාස හා ප්‍රජා පහසුකම් | 1,118,000 | 21,000,000 |
| | 63 වැනි වැඩසටහන - වැව්ලි යටිතල පහසුකම් හා වතු නිවාස | - | 45,000,000 |
| | 71 වැනි වැඩසටහන - රෝහල් සේවාවන් | 20,900,000 | 288,390,000 |
| | 72 වැනි වැඩසටහන - මහජන සෞඛ්‍ය සේවාවන් | 20,000,000 | 146,610,000 |

| ශීර්ෂය | ආයතන හා වැඩ සටහන | පුනරාවර්තන වියදම රුපියල් | ප්‍රාග්ධන වියදම රුපියල් |
|---|---|---|---|
| | 73 වැනි වැඩසටහන - දේශීය වෛද්‍ය සේවාවන් | - | 105,000,000 |
| | 93 ආගමික හා සංස්කෘතික කටයුතු | - | - |
| | 96 වැනි වැඩසටහන - කාන්තා සංවර්ධනය | - | 2,000,000 |
| 811 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 167,800,000 | |
| | 71 වැනි වැඩසටහන - රෝහල් සේවාවන් | 3,574,920,000 | |
| | 72 වැනි වැඩසටහන - මහජන සෞඛ්‍ය සේවාවන් | 767,158,000 | |
| 812 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | | |
| | 73 වැනි වැඩසටහන - දේශීය වෛද්‍ය සේවාවන් | 328,209,000 | |
| 813 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | 53 වැනි වැඩසටහන - සමුපකාර සංවර්ධනය | 51,112,000 | |
| 814 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | | |
| | 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධනය | 1,220,603,000 | |
| 820 | පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 35,411,000 | - |
| | 50 වැනි වැඩසටහන - ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 250,000,000 | 250,000,000 |
| | 52 වැනි වැඩසටහන - ප්‍රාදේශීය සංවර්ධනය | - | 30,000,000 |
| | 90 වැනි වැඩසටහන - විනෝද කටයුතු හා ක්‍රීඩා | - | 135,000,000 |
| 821 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | 90 වැනි වැඩසටහන - විනෝද කටයුතු හා ක්‍රීඩා | 41,905,000 | |
| 830 | සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 25,625,000 | 7,000,000 |
| | 51 වැනි වැඩසටහන - කර්මාන්ත සංවර්ධනය | - | 64,500,000 |
| | 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධනය | 20,838,000 | 65,500,000 |
| | 95 වැනි වැඩසටහන - සමාජ ආරක්ෂණය | 32,800,000 | 143,000,000 |
| 831 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | 51 වැනි වැඩසටහන - කර්මාන්ත සංවර්ධනය | 93,214,000 | |
| 832 | පරිවාස, ළමාරක්ෂක හා සමාජසේවා දෙපාර්තමේන්තුව | | |
| | 95 වැනි වැඩසටහන - සමාජ ආරක්ෂණය | 215,333,000 | |
| 840 | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 68,426,000 | 40,000,000 |
| | 80 වැනි වැඩසටහන - ප්‍රාථමික අධ්‍යාපනය | 9,500,000 | 105,000,000 |
| | 81 වැනි වැඩසටහන - ද්විතීයික අධ්‍යාපනය | 87,600,000 | 515,000,000 |
| | 93 වැනි වැඩසටහන - ආගමික හා සංස්කෘතික කටයුතු | 10,835,000 | 25,000,000 |
| 841 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 356,285,000 | |
| | 80 වැනි වැඩසටහන - ප්‍රාථමික අධ්‍යාපනය | 3,380,550,000 | |

| ශීර්ෂය | ආයතන හා වැඩ සටහන | පුනරාවර්තන වියදම රුපියල් | ප්‍රාග්ධන වියදම රුපියල් |
|---|---|---|---|
| | 81 වැනි වැඩසටහන - ද්විතීයික අධ්‍යාපනය | 6,425,245,000 | |
| | 87 වැනි වැඩසටහන - අධ්‍යාපන සහභාගීත්වය වැඩිදියුණු කිරීම | 4,775,000 | |
| | 88 වැනි වැඩසටහන - අධ්‍යාපන සැළසුම්කරණය පාලනය හා සේවා සැපයීම | 420,000 | |
| 850 | ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 28,368,000 | 30,000,000 |
| | 40 වැනි වැඩසටහන - ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | - | 21,000,000 |
| | 43 වැනි වැඩසටහන - වාරිමාර්ග හා ජල කළමනාකරණය | 25,000,000 | 110,000,000 |
| | 44 වැනි වැඩසටහන - කෘෂිකාර්මික සංවර්ධනය | - | 183,000,000 |
| | 45 වැනි වැඩසටහන - පශු සම්පත් සංවර්ධනය | - | 153,000,000 |
| | 55 වැනි වැඩසටහන - ආහාර සුරක්ෂිතතාව පවත්වාගැනීම | - | 24,000,000 |
| 851 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | |
| | 40 වැනි වැඩසටහන - ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 52,507,000 | |
| 852 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | |
| | 44 වැනි වැඩසටහන - කෘෂිකාර්මික සංවර්ධනය | 170,916,000 | |
| 853 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | 45 වැනි වැඩසටහන - පශු සම්පත් සංවර්ධනය | 170,436,000 | |
| 861 | පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 10,536,000 | |
| | | **18,341,100,000** | **3,000,000,000** |

දෙවන උපලේඛනය

2025 - මුල් මාස හතර සඳහා ඇස්තමේන්තුව

**2025 - Estimates for the First Four Months**

අත්තිකාරම් ගිණුම් කටයුතු

**Advance Account Activities**

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු Ministry / Department | විෂය අංකය Code No. | අත්තිකාරම් වර්ගය Categories of Advances | උපරිම වියදම් සීමාව Maximum Limit of Expenditure | අවම ලැබීම් සීමාව Minimum Limit of Receipts | හර ශේෂයේ උපරිම සීමාව Maximum Limit of Debit Balance | බැරකම් වල උපරිම සීමාව Maximum Limit of Liabilities |
| | මුළු එකතුව Grand Total | | | **1,050,818,000** | **442,138,000** | **3,246,217,200** | **8,150,000** |
| | පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් Provincial Public Officer's Advance Accounts | | උප එකතුව Sub Total | **842,418,000** | **334,324,000** | **3,187,681,200** | **-** |
| 1 | ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය Office of the Hon' Governor | 80001 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් Provincial P: O: Advance | 600,000 | 200,000 | 2,520,000 | - |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු<br>Ministry / Department | විෂය අංකය<br>Code No. | අත්තිකාරම් වර්ගය<br>Categories of Advances | උපරිම වියදම් සීමාව<br>Maximum Limit of Expenditure | අවම ලැබීම් සීමාව<br>Minimum Limit of Receipts | හර ශේෂයේ උපරිම සීමාව<br>Maximum Limit of Debit Balance | බැරකම් වල උපරිම සීමාව<br>Maximum Limit of Liabilities |
| 2 | පළාත් සභා ලේකම් කාර්යාලය<br>Provincial Council Secretariat | 80101 | පළාත් රාඃ නිඃ අත්තිකාරම්<br>Provincial P: O: Advance | 1,000,000 | 340,000 | 5,760,000 | - |
| 3 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය<br>Office of the Provincial Public Service Commission | 80201 | පළාත් රාඃ නිඃ අත්තිකාරම්<br>Provincial P: O: Advance | 1,800,000 | 800,000 | 5,100,000 | - |
| 4 | සමුපකාර සේවක කොමිෂන් සභා කාර්යාලය<br>Office of the Co-operative Employees Commission | 80301 | පළාත් රාඃ නිඃ අත්තිකාරම්<br>Provincial P: O: Advance | 300,000 | 200,000 | 2,752,000 | - |
| 5 | ප්‍රධාන ලේකම්<br>Chief Secretary | 80401 | පළාත් රාඃ නිඃ අත්තිකාරම්<br>Provincial P: O: Advance | 4,500,000 | 1,625,000 | 15,125,000 | - |
| 6 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br>Deputy Chief Secretary (Personnel & Training) | 80501 | පළාත් රාඃ නිඃ අත්තිකාරම්<br>Provincial P: O: Advance | 1,000,000 | 250,000 | 3,750,000 | |
| 7 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ)<br>Deputy Chief Secretary Finance Management | 80601 | පළාත් රාඃ නිඃ අත්තිකාරම්<br>Provincial P: O: Advance | 2,000,000 | 800,000 | 1,500,000 | |
| 8 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන)<br>Deputy Chief Secretary (Planning) | 80701 | පළාත් රාඃ නිඃ අත්තිකාරම්<br>Provincial P: O: Advance | 2,000,000 | 800,000 | 2,200,000 | |
| 9 | 810 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)<br>(Deputy Chief Secretary) Engineering Service | 80801 | පළාත් රාඃ නිඃ අත්තිකාරම්<br>Provincial P: O: Advance | 15,000,000 | 4,500,000 | 72,700,000 | - |
| 10 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව<br>Department of Provincial Revenue<br>810 - නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 80901 | පළාත් රාඃ නිඃ අත්තිකාරම්<br>Provincial P: O: Advance | 1,300,000 | 800,000 | 4,300,000 | - |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු<br>Ministry / Department | විෂය අංකය<br>Code No. | අත්තිකාරම් වර්ගය<br>Categories of Advances | උපරිම වියදම් සීමාව<br>Maximum Limit of Expenditure | අවම ලැබීම් සීමාව<br>Minimum Limit of Receipts | හර ශේෂයේ උපරිම සීමාව<br>Maximum Limit of Debit Balance | බැරකම් වල උපරිම සීමාව<br>Maximum Limit of Liabilities |
| 11 | 810 - Ministry of Law and Order, Finance and Planning, Local Government, Health, Indigenous Medicine and Women's Affairs, Co-operative, Trade and Food, Transport, Estate Welfare, Environment, Media, Housing and Construction & Religious Affairs. | 81001 | පළාත් රාः නිः අත්තිකාරම්<br>Provincial P: O: Advance | 1,250,000 | 875,000 | 30,375,000 | - |
| 12 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>Department of Health | 81101 | පළාත් රාः නිः අත්තිකාරම්<br>Provincial P: O: Advance | 200,000,000 | 50,000,000 | 1,262,500,000 | - |
| 13 | ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>Department of Indigenous Medicine | 81201 | පළාත් රාः නිः අත්තිකාරම්<br>Provincial P: O: Advance | 11,000,000 | 4,000,000 | 65,000,000 | - |
| 14 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව<br>Department of Co-operative Development | 81301 | පළාත් රාः නිः අත්තිකාරම්<br>Provincial P: O: Advance | 5,000,000 | 1,500,000 | 22,000,000 | - |
| 15 | පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>Department of Local Government | 81401 | පළාත් රාः නිः අත්තිකාරම්<br>Provincial P: O: Advance | 4,000,000 | 1,200,000 | 21,305,000 | - |
| 16 | පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Provincial Roads Development, Rural Infrastructure, Tourism and Sports & Youth Affairs | 82001 | පළාත් රාः නිः අත්තිකාරම්<br>Provincial P: O: Advance | 1,667,000 | 650,000 | 16,363,000 | - |
| 17 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>Department of Sports Development | 82101 | පළාත් රාः නිः අත්තිකාරම්<br>Provincial P: O: Advance | 1,167,000 | 334,000 | 8,834,000 | - |
| 18 | සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය<br>Ministry of Social Welfare, Probation and Childcare, Rural Development and Rural Industries | 83001 | පළාත් රාः නිः අත්තිකාරම්<br>Provincial P: O: Advance | 2,820,000 | 1,200,000 | 18,120,000 | - |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු<br>Ministry / Department | විෂය අංකය<br>Code No. | අත්තිකාරම් වර්ගය<br>Categories of Advances | උපරිම වියදම් සීමාව<br>Maximum Limit of Expenditure | අවම ලැබීම් සීමාව<br>Minimum Limit of Receipts | හර ශේෂයේ උපරිම සීමාව<br>Maximum Limit of Debit Balance | බැරකම් වල උපරිම සීමාව<br>Maximum Limit of Liabilities |
| 19 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව<br>Department of Industrial Development | 83101 | පළාත් රාː නිː අත්තිකාරම්<br>Provincial P: O: Advance | 6,000,000 | 3,000,000 | 31,000,000 | - |
| 20 | පරිවාස, ළමාරක්ෂක හා සමාජසේවා දෙපාර්තමේන්තුව<br>Department of Probation, Childcare and Social Services | 83201 | පළාත් රාː නිː අත්තිකාරම්<br>Provincial P: O: Advance | 3,000,000 | 1,850,000 | 26,150,000 | - |
| 21 | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Education, Information Technology and Cultural Affairs | 84001 | පළාත් රාː නිː අත්තිකාරම්<br>Provincial P: O: Advance | 3,200,000 | 700,000 | 23,900,000 | - |
| 22 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>Department of Education | 84101 | පළාත් රාː නිː අත්තිකාරම්<br>Provincial P: O: Advance | 555,264,000 | 250,000,000 | 1,407,192,000 | - |
| 23 | ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Lands, Provincial Irrigation, Agriculture, Animal Production and Animal Health & Fisheries | 85001 | පළාත් රාː නිː අත්තිකාරම්<br>Provincial P: O: Advance | 1,500,000 | 550,000 | 10,950,000 | - |
| 24 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව<br>Department of Land Commissioner | 85101 | පළාත් රාː නිː අත්තිකාරම්<br>Provincial P: O: Advance | 3,200,000 | 1,000,000 | 23,150,000 | - |
| 25 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>Department of Agriculture | 85201 | පළාත් රාː නිː අත්තිකාරම්<br>Provincial P: O: Advance | 8,250,000 | 4,250,000 | 76,000,000 | - |
| 26 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>Department of Animal Production and Health | 85301 | පළාත් රාː නිː අත්තිකාරම්<br>Provincial P: O: Advance | 5,000,000 | 2,500,000 | 24,670,000 | - |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු Ministry / Department | | විෂය අංකය Code No. | අත්තිකාරම් වර්ගය Categories of Advances | උපරිම වියදම් සීමාව Maximum Limit of Expenditure | අවම ලැබීම් සීමාව Minimum Limit of Receipts | හර ශේෂයේ උපරිම සීමාව Maximum Limit of Debit Balance | බැරකම් වල උපරිම සීමාව Maximum Limit of Liabilities |
| 27 | පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව Department of Provincial Internal Audit | 86101 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් Provincial P: O: Advance | 600,000 | 400,000 | 4,465,200 | - |
| 28 | පළාත් සභා ලේකම් කාර්යාලය Provincial Council Secretariat | 80102 | මන්ත්‍රීවරුන්ට විවිධ අත්තිකාරම් Miscellaneous Advance for Council Members | 26,400,000 | 1,584,000 | 24,816,000 | - |
| 29 | කළමනාකරණ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය - පුස්සැල්ල Management Development & Training Centre - Pussella 810 - නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 80502 | පුහුණු මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම් Trainning Center Advance Accounts | 20,000,000 | 22,000,000 | 1,000,000 | 350,000 |
| 30 | 810 - Ministry of Law and Order, Finance and Planning, Local Government, Health, Indigenous Medicine and Women's Affairs, Co-operative, Trade and Food, Transport, Estate Welfare, Environment, Media, Housing and Construction & Religious Affairs | 81004 | සබරගමුව පළාත් රංගශාලා අත්තිකාරම් ගිණුම Sabaragamuwa Provincial Theater Advance Account | 1,500,000 | 500,000 | 1,050,000 | |
| 31 | ආයුර්වේද දෙපාර්තමේන්තුව Department of Indigenous Medicine | 81202 | පින්නවල පංචකර්ම මධ්‍යස්ථානය Panchakarma Centre - Pinnawala | 500,000 | 230,000 | 170,000 | 300,000 |
| 32 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව Department of Industrial Development | 83102 | පේෂකර්ම වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය Establishment of Textile Workshops and Management | 60,000,000 | 30,000,000 | 15,000,000 | 2,000,000 |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු Ministry / Department | විෂය අංකය Code No. | අත්තිකාරම් වර්ගය Categories of Advances | උපරිම වියදම් සීමාව Maximum Limit of Expenditure | අවම ලැබීම් සීමාව Minimum Limit of Receipts | හර ශේෂයේ උපරිම සීමාව Maximum Limit of Debit Balance | බැරකම් වල උපරිම සීමාව Maximum Limit of Liabilities |
| 33 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව Department of Industrial Development | 83103 | කුඩා කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය Establishment of Small Industrial Workshops and Management | 20,000,000 | 8,000,000 | 8,000,000 | 1,000,000 |
| 34 | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය Ministry of Education, Information Technology and Cultural Affairs | 84002 | මෙනේරිපිටිය - අටළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම Meneripitiya - Atulugama Education Development Centre | 40,000,000 | 15,000,000 | 5,000,000 | 500,000 |
| 35 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව Department of Agriculture | 85202 | Agri Fresh අලෙවිසැලේ කටයුතු පවත්වාගෙන යාම සඳහා වාණිජ අත්තිකාරම් ගිණුම Agri Fresh Shop- Advance Account | 8,000,000 | 3,000,000 | 1,000,000 | 500,000 |
| 36 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව Department of Agriculture | 85203 | රජවක සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය අත්තිකාරම් ගිණුම Rajawaka - Agriculture in service Training institute Advance Account | 5,000,000 | 2,500,000 | 1,000,000 | 500,000 |
| 37 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව Department of Animal Production and Health | 85302 | උඩුගොඩ සත්ත්ව පාලන සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම Animal Husbandry Development and Training Center | 16,000,000 | 12,000,000 | 500,000 | 2,000,000 |
| 38 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව Department of Animal Production and Health | 85303 | රත්නපුර පශු වෛද්‍ය රෝහල සඳහා වාණිජ අත්තිකාරම් ගිණුම Ratnapura Veterinary Hospital Advance Account | 11,000,000 | 13,000,000 | 1,000,000 | 1,000,000 |

### අධිකාරී බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2025 අප්‍රේල් මස 30 වන දිනෙන් අවසන් වන මාස හතරක කාල සීමාව තුළ සබරගමුව පළාත් සභාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රුපියල් විසිඑක් බිලියන තුන්සිය හතලිස් එක් මිලියන එකසිය දහසක් (රු. 21,341,100,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන්දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.

මෙම අවසරය සබරගමුව පළාතේ හත්වන (7 වන) පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2025 අප්‍රේල් මස 30 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේය.

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය යටතේ ගරු ආණ්ඩුකාරතුමිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 නොවැම්බර් මස 29 වන දින අනුමත කරන ලද 2025 වර්ෂයේ මුල් මාස හතර සඳහා ආදායම් වියදම් ඇස්තමේන්තුව මේ අනුව සංශෝධනය වේ.

ඒ.ඒ.සී.ජේ. රාජරත්න.
ගරු ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2024 දෙසැම්බර් 30 වෙනි දින

EOG 01 - 0112/2

### අධිකාරී බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2025 අප්‍රේල් මස 30 වන දිනෙන් අවසන් වන මාස හතරක කාල සීමාව තුළ සබරගමුව පළාත් සභාවේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති මෙහි දෙවන (II) උපලේඛනයේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන්දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.

මෙම අවසරය සබරගමුව පළාතේ හත්වන (7 වන) පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2025 අප්‍රේල් මස 30 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේය.

ඒ.ඒ.සී.ජේ. රාජරත්න.
ගරු ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2024 දෙසැම්බර් 30. වෙනි දින

EOG 01 - 0112/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.